# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

සංවර්ධන නිලධාරි II ශ්‍රේණිය/ තොරතුරු තාක්ෂණ සහකාර II ශ්‍රේණිය/ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) II ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීම (අභ්‍යන්තර පදනම)

ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත්‍රය මෙතැනින් බාගත කර ගන්න

| | අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද | බඳවාගැනීමේ ක්‍රමවේදය | වැටුප |
|---|---|---|---|
| සංවර්ධන නිලධාරි II ශ්‍රේණිය | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත්, වානිජ්‍ය ගණකාධිකරණය, කළමනාකරණය, අලෙවිකරණය, භෞතිය විද්‍යාව, තොරතුරු තාක්ෂණය, ගණිතය, සංඛ්‍යාලේඛනය, නීතිය, ආර්ථික විද්‍යාව, පරිසනක විද්‍යාව, ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ පිළිබඳ උපාධිය<br>සහ<br>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ මෙහෙයුම්, කළමනාකරණ සහකාර (තාක්ෂණික), කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයකට අයත් ස්ථිර තනතුරක පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. පුහුණු කාල සීමා හෝ අනියම්/තාවකාලික තනතුරු දැරූ කාල පරිච්ඡේද අදාළ නොවේ. | ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීම සිදු කෙරේ. ලිඛිත විභාගයේදී සෑම විෂයකටම ලකුණු 40ට වඩා ලබාගත යුතු අතර විෂයන් සියල්ලේම ලකුණු එකතුව 50% වැඩි විය යුතුය. තරඟ විභාගයේ දී විෂයන් සියල්ලටම ලබාගත් ලකුණු සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණුවල එකතුව අනුව සකස් කරන කුසලතා අනුපිළිවෙල මත පමණක් පත්වීම් සිදු කෙරේ. ලිඛිත විභාගය ප්‍රශ්ණ පත්‍ර දෙකකින් සමන් විත වේ. (I) බුද්ධි පරීක්ෂණය (II) භාෂා හැකියාව එම විෂයයන් වේ | TRC 6.1 - 54400- (10x1020)-(10x1360)-(10x1700) -(10x2040)-115600 |
| තොරතුරු තාක්ෂණ සහකාර II ශ්‍රේණිය | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයන් 4ට සම්මාන සහිතව එක් වරකදි විෂයන් හයක් සමත් වී තිබීම<br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ විෂයන් තුනක් සමත් ව තිබීම<br>සහ<br>කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික ආයතනයක් විසින් පවත්වනු ලැබූ NVQ 5 මට්ටමට නොඅඩු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථකව නිමකර තිබීම<br>සහ<br>විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රාථමික (ශිල්පීය හෝ ශිල්පීය නොවන) මට්ටමේ තනතුරක වසර 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම | ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීම සිදු කෙරේ. ලිඛිත විභාගයේදී සෑම විෂයකටම ලකුණු 40ට වඩා ලබාගත යුතු අතර විෂයන් සියල්ලේම ලකුණු එකතුව 50% වැඩි විය යුතුය. තරඟ විභාගයේ දී විෂයන් සියල්ලටම ලබාගත් ලකුණු සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණුවල එකතුව අනුව සකස් කරන කුසලතා අනුපිළිවෙල මත පමණක් පත්වීම් සිදු කෙරේ. ලිඛිත විභාගය ප්‍රශ්ණ පත්‍ර දෙකකින් සමන් විත වේ. (I) භාෂා හැකියාව හා බුද්ධි පරීක්ෂණය (II) අදාළ තනතුරේ විෂය දැනුම එම විෂයයන් වේ | TRC 8.1 - 51680- (10x1020)-(10x1360)-(10x1700) -)-(10x2040)-112880 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) II ශ්‍රේණිය | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී එක් වරකදී විෂයන් දෙකකට සම්මාන සහිතව සිංහල/දෙමළ භාෂාව හා ගණිතය විෂය ඇතුළුව විෂයන් හයක් සමත් වී තිබීම.<br>සහ<br>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ තාක්ෂණික, ප්‍රාථමික (ශිල්පීය), ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ගණයකට අයත් ස්ථිර තනතුරක පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. පුහුණු කාල සීමා හෝ අනියම්/තාවකාලික තනතුරු දැරූ කාල පරිච්ඡේද අදාළ නොවේ. | ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීම සිදු කෙරේ. ලිඛිත විභාගයේදී සෑම විෂයකටම ලකුණු 40ට වඩා ලබාගත යුතුය. තරඟ විභාගයේ දී විෂයන් සියල්ලටම ලබාගත් ලකුණු සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණුවල එකතුව අනුව සකස් කරන කුසලතා අනුපිළිවෙල මත පමණක් පත්වීම් සිදු කෙරේ. ලිඛිත විභාගය ප්‍රශ්ණ පත්‍ර තුනකින් සමන් විත වේ. (I) භාෂා ප්‍රවීණතාවය (II) අභියෝගාතාවය (III) පරිගණක පරීක්ෂණය එම විෂයයන් වේ | TRC 8.2 - 46240- (10x680) -(10x1020)-(10x1360)-(10x1700) -93840. |

**(6) පොදු කොන්දේසි :**

- මෙම පත්කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත්කිරීම් රීති කාණ්ඩයේ VI පරිච්ඡේදයේ 77 වන වගන්තියට ප්‍රකාරව වසරක වැඩබැලීමේ කාලයකට යටත් වේ.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා බඳවා ගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.

**(7) අයදුම්කිරීමේ ක්‍රමය :**

අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ඉහත සබැඳියෙන් බාගත කරගත් අයදුම්පත් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර වල ඡායා පිටපත් (මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කල යුතුවේ) සමඟ ඔබගේ අංශ ප්‍රධානීගේ නිර්දේශය ද සහිතව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර පාලන හා ආයතන කටයුතු අංශය වෙත භාරදිය යුතු ය. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරට අයදුම්කරන අපේක්ෂකයන්ට අයදුම්පත් පාලන අංශයෙන් ද ලබාගත හැක.

අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2023.10.26 වේ


අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
අංක.276
ඇල්විටිගල මාවත
කොළඹ 08